


# චාලි චැප්ලින්

**පනස්** හතර හැවිරිදි චාලි චැප්ලින්, දහ අට හැවිරිදි උෟනා ඕ'නීල් හමුව, "සොඳුර, මා හා විවාහ වන්න, ඔබට මා ජීවත්වන හැටි කියාදෙන්නම්, ඔබ මට සතුටින් මරණය තෙක් පියනඟන'අයුරු කියාදෙන්න" යැයි කීය.

ඊට පිළිතුරු දුන් උෟනා, "චාලි, මා ඔබ හා විවාපත් වන්නම්. නමුත් ඔබ ඇසූව වෙනුවට, හැකි නම් ඔබ මට මුහුකුරා වියපත්වන හැටි කියා දෙන්න. මම ඔබට තරුණව වෙසෙන හැටි කියා දෙන්නම්" යැයි කීය.

ඔවුන් එසේ විවාපත් වී, වසර තිස් හතරක් සතුටින් ජීවත් ව දරුවන් අටක් ලැබීය!

චාලි හදවතින් තරුණව අසූ අට අවුරුද්දක් ජීවිතය ගෙවා තිබිණි.

එක්තරා සීත වූ දෙසැම්බර් විසිහතර වන දාවක, රෝද පුටුවට සීමාව සිටි අසූ අට හැවිරිදි චාලි චැප්ලින් සිය බිරින්දෑ වූ උෟනා සමගින් අවසානම වතාවට කෙටි සැඳෑ සවාරියක නියැලී ගෙට වන්හ. 1977 හි සීතල නත්තල උදා වී තිබුණු අතර අළුයම් පළමු හෝරාවේ දී සිය දරුවන් අටෙන්, හත් දෙනෙකුගේ උණුසුම් ආදරය මධ්‍යයේ, පිය උෟනා ගේ කඳුළු පිරි දෙනෙතෙහි දුටු උතුරා පිටාර



ගැලූ සෙනේහය දකිමින් චැප්ලින් සිය විඩාබර හෘද පේශීන් සදාකාලයටම විරාම ගන්වා තිබිණි!

එලෙස සාමකාමී මරණයකින් නිහඬව ගිය දේහයට සාමයක් උදා නොවුනේ කිසිවෙකු සොහොන බිඳ චාලි චැප්ලින් ගේ මළ දේහය සොරාගෙන ගොස් තිබූ බැවිනි.

තොරතෝන්චියක් නැති දුරකතන ඇමතුම් විසි හතකින් සිදුකළ බියගැන්වීම්, කරදර කිරීම් හා අපහාසයෙන් පසු මළ දේහය සඳහා පවුම් 40,000ක කප්පමක් ඉල්ලා තරුණ කටහඬක් කතාකර තිබිණි.

සිනාමුසු මුහුණින් සියල්ල පිළිකෙව් කොට තිබූ උෟනා මහත්මිය ඒ අසැබි තරුණයා අමතා මෙසේ පැවසීය,

"මළ කුණ ඔබ ලග තබා ගන්න, චාලි මා හදවතෙහි ජීවත් ව හිඳී"

දුරකතනය පසෙකින් තැබූ උෟනා, චාලි ගේ මළකුණ හැරදා පියා සුවපහසු නින්දකට වන් හ. සමහර විට ඈ තිස් හතර අවුරුද්දකට පෙර විවාහ යෝජනාවේ පොරොන්දුව හීනයෙන් දැක ගන්නට ඇත!

උපුටන ඓතිහාසික ඡායාරූප නොසැලෙයි පිටුවෙන් ස්තුතියි.

**- නිරෝෂා හේමන්ති -**




# අතීත උරුමයක සොඳුරු මතක සටහන්

## Souvenirs of a Forgotten Heritage by Gamini de S.G. Punchihewa

**යසපාල වනසිංහ, රත්නායක වනසිංහ**

සූරිය ප්‍රකාශන.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය ලෙසින් හැඳින්වෙන්නේ ගල් ඔය සංවර්ධන ව්‍යාපාරය. සේනානායක සමුද්‍රය මුල් කරගෙන ආරම්භ වෙන මෙම ව්‍යාපෘතිය හේතුවෙන් දිඟාමඬුලු පෙදෙස දැඩි වෙනස්කම්වලට භාජනය වෙනවා. එය එක් අයුරකින් සංවර්ධනයක් වූවත් මිශ්‍ර ප්‍රතිඵල ලබාදෙන්නක්. ගල් ඔය සංවර්ධන ව්‍යාපාරයේ ලිපිකරු පත්වීමක් ලබන ගාමිණී එස්.ජී. පුංචිහේවා මහතා එහි පැමිණෙන්නේ වර්ෂ 1955 දී. එතැන් පටන් වසර ගණනාවක් පුරාවට එම ව්‍යාපෘතිය තුළ දී ඔහු ලබන අත්දැකීම් යම් ප්‍රමාණයක්, Souvenirs of a Forgotten Heritage නමින් ග්‍රන්ථයක් ලෙස එළි දකිනවා.

ගාමිණී එස්.ජී. පුංචිහේවා මහතා, සංවර්ධන ව්‍යාපාරය හේතුවෙන් දිඟාමඬුලු පෙදෙසින් වියැකී යමින් තිබූ සංස්කෘතිය දෙසට වැඩි අවධානයක් යොමුකර ඇති බව මෙම ලිපි එකතුවෙන් පැහැදිලියි. පිටස්තර ජනයා පදිංචි වීමට පෙර එහි තිබූ ජීවන රටාව, යන්ත්‍ර මන්ත්‍ර, වෙදහෙදකම්, ගැමි කලා කටයුතු පිළිබඳ තොරතුරු කෘතිය තුළ අඩංගු වී ඇත. එමෙන්ම පුංචිහේවා මහතා, ප්‍රදේශය පුරාවට පැතිරී තිබූ පුරා විද්‍යාත්මක නටඹුන් පිළිබඳව ද ලුහුඬින් විස්තර කර ඇති අයුරු දක්නට හැකියි. රූප සටහන් සහ ඡායාරූප ද ඇතුළත් වීම වැඩි වටිනාකමක් පොතට ගෙන ඒ. නමුත් ඇතැම් ඡායාරූප එතරම් පැහැදිලි නොවීම අභාග්‍යකි.

මෙහි ඇති තවත් සුවිශේෂි කරුණක් වන්නේ, වෛද්‍ය R.L. Spittle මහතාගේ දැඩි අවධානයට පාත්‍ර වූ වැදි ජනතාව පිළිබඳ තොරතුරු එකතුවක් එක්කර තිබීම. Spittle මහතා පිය නැගූ මාවත් හි සැරිසැරීමටත් ඔහුගේ කෘතීන් හි කතානායකයන් වූ වැදි පරපුරේ ඇතැම් සාමාජිකයන් හමුවීමට ත් පුංචිහේවා මහතා වාසනාවන්ත වී ඇති බව පෙනී යනවා. දිඟාමඬුලු වනපෙත් වල තොරතුරුත් (ශාක ,පක්ෂීන්, සිව්පාවුන්) යම් තරමකට මෙහි ඇතුළත්.

ගාමිණී එස්,ජී පුංචිහේවා මහතා, තම අත්දැකීම් එකින් එක එකතුකරගන්නා කාලය වනවිට ද මෙහි ඇති මතකයන් වියැකී යාම ආරම්භ වී අවසන්. ඉදින් මේ වනවිට එම බොහෝ මතක පොත් පිටු වලටම සීමාවී ඇතැයි සිතමි.

**- නවෝද්‍යා කොළඹගේ -**